／
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2296/08 - 2022 සැප්තැම්බර් මස 07 වැනි බදාදා - 2022.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978 (x) (සී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 101137 දරන සමාගමක් වන, එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2022 මාර්තු මස 21 වැනි දින අංක 2272/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "ඇඟලුම් සහ රෙදි පිළි තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය" යන සටහනට සහ, එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විලාසිතා වෙළඳ භාණ්ඩ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ව්‍යාවහාරික තොරතුරු තාක්ෂණය පිළබඳ උපාධිය සම්බන්ධයෙන් වන උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂය ධාරාවක් යටතේ මුහුණ දී එකවර සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

1A - PG 5959 — 286 (2022/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| විලාසිතා වෙළඳ භාණ්ඩ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | බීඑස්සී (විලාසිතා වෙළෙඳ භාණ්ඩ කළමනාකරණය) |
| ව්‍යවහාරික තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය | බීඒඅයිටී |

ආචාර්ය ඒ. ඩී. **සුසිල් ප්‍රේමජයන්ත** (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0041

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.